SINHALI
HIGHLIGHTS LIFE CHRIST



# ක්‍රිස්තු ජීවිතයේ ප්‍රධාන සිද්ධීන්

## 5

යේසුස්වහන්සේ අප උදෙසා
මරණය විඳියි

- යේසුතුමා ගැන කුමන්ත්‍රණයක්
- පාස්කුව
- යේසුතුමා ගෙත්සෙමනේදී
- යේසුතුමාගේ නඩු විභාගය
- යේසුතුමා කුරුස පත්වෙයි
- යේසුතුමා කමාවීම උගන්වයි

# යේසුතුමා ගැන කුමන්ත්‍රණයක්

ඔවුන්ගේ පාප වලට එරෙහිව දේශනා කළ බැවින් ප්‍රධාන ආගමික නායකයෝ යේසුස් වහන්සේට ද්වේශ කළහ. සමූහයා උන්වහන්සේ අනුව ගිය බැවින් ඔවුන් ඊර්ෂ්‍යා කළහ. උන්වහන්සේ රෝගීන් සුව කළ අතර මිය ගිය කිහිප දෙනෙක් පවා යළි ජීවනයට ගෙනා සේක. ගැලවුම්කාරයාණන් පිළිබඳ අනාගත කීම් යේසුස් වහන්සේ සම්පූර්ණ කළද උන්වහන්සේ පිළිගැනීමට නායකයෝ ප්‍රතික්ෂේප කළෝය. යේසුස් වහන්සේ විප්ලවවාදියෙකැයි චෝදනා කර අත් අඩංගුවට ගෙන මරා දමන්නට ඔවුන් තීරණය කළහ. ප්‍රසිද්ධියේ ගතහොත් සමූහයා උන්වහන් සේව බේරා ගනිතියි ඔවුන් බියවූහ. එබැවින් රාත්‍රියේදී ඔවුන්ට මඟ පෙන්වනු පිණිස ඔවුහු උන්වහන්සේගේ ගෝලයෙකුවූ යූදස් ඉස්කාරියොත්ට අල්ලස් දුන්හ.

**ඔබේ අභ්‍යාසය සඳහා**

1. යේසුස් වහන්සේගේ සතුරන් වූයේ කවරුන්ද?
   ... (අ) සාමාන්‍ය ජනතාව.
   ... (ආ) ආගමික නායකයන්ගෙන් සමහරෙක්.
   ... (ඇ) රෝම රාජ්‍ය නිලධාරීන්.

# පාස්කුව

පාස්කුව වනාහි දෙවියන්වහන්සේ තමන්ගේ සෙනඟ වහල් කමින් මුදා ගැන්මේ සුදනම් වීමේ කාලයයි. සෑම අවුරුද්දකම පාස්කුවට පාප පූජාවක් කොට බැටළු පැටවෙක් මරණ ලදී. මෙය යේසුස් වහන්සේගේ මරණය විඳීමේ සංකේතයක් විය. යේසුස් වහන්සේ සිය සේවය ඇරඹූ විට යොහන් බව්තිස්ත උන්වහන්සේව හැඳින්වූයේ ''ලෝකයේ පාපය දුරු කරන දෙවියන් වහන්සේගේ බැටළු පැටවාණන්'' යනුවෙනි. මේ කාරිය කිරීම පිණිස අපගේ පාපවල දඬුවම පවරා ගනිමින් අපගේ තැන ගෙන මරණය විඳීමට උන් වහන්සේට සිදුවිය. යේසුස් වහන්සේ තම ගෝලයන් සමඟ පාස්කු රාත්‍රි භෝජනය වැළඳූ පසු යූදස් උන්වහන්සේව පාවා දෙන්ට ගියේය.

ඉංග්‍රීසි – 1970 ජාත්‍යන්තර නැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය
සිංහල – 1982 ජාත්‍යන්තර නැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය

**ඔබේ අභ්‍යාසය සඳහා**

2. යොහන් යේසුස් වහන්සේව හැඳින්වූයේ කෙසේද?

... (අ) දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලෙස.

... (ආ) පාපය දුරුකරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණන් ලෙස.

... (ඇ) පොරොන්දුවූ ගැලවුම් කරුවාණන් ලෙස

...

# යේසුතුමා ගෙත්සෙමනේදී

## යේසුස්වහන්සේ යාච්ඤා කරයි

යුදස් තමාව පාවා දෙන බව යේසුස් වහන්සේ දැන සිටි සේක. ඉන් වැලකීමට හැකියාව තිබූ නමුත් උන්වහන්සේ මෙලොවට පැමිණියේ අපගේ ස්ථානය ගෙන මරණය විඳීමටය. තමන් කුරුස පත්වන බවත් තුන් වැනිද නැවත ජීවනයට පැමිණෙන බවත් එතුමා තම ගෝලයනට පවසා තිබුණි. රාත්‍රි භෝජනයෙන් පසු යේසුස් වහන්සේ හා ගෝලයින් ගෙත්සෙමන උයනට ගියහ. යාච්ඤා කිරීමට බොහෝ විට ඔවුන් එහි ගියහ.

ඔවුන් ගෙත්සෙමන නම් තැනට පැමිණි පසු මා යාච්ඤා කරන තුරු මෙහි වාඩිවී සිටින්න'යි යේසුස් වහන්සේ ගෝලයනට කී සේක. එවිට උන්වහන්සේ පේත්‍රුස් යාකොබ් හා යොහන්ව කැඳවා ගෙන ගිය සේක. උන් වහන්සේ ශෝකවන්ටත් කැළඹෙන්ටත් වී ඔවුන් අමතා මෙසේ පැවසූ සේක. ''මා සිත් තුල ඇති ශෝකය මා පොඩිකරන තරමට මහත්ය. මා සමහ නැවතී අවදිව සිටින්න''. උන් වහන්සේ මඳක් ඉදිරියට ගොස් බිම වැතිර හැකි නම් එම පීඩා පැය තුලින් නොයන්ට යාච්ඤා කළ සේක. උන්වහන්සේ යාච්ඤා කරමින් ''පියාණෙනි මාගේ පියාණෙනි ඔබ වහන්සේට සියල්ල පුළුවන. මේ කුසලාන මගෙන් ඉවත් කළ මැනව. එහෙත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත සිදුවේවා''යි කීසේක. මාර්ක් 14:32–36



කිසි වරදක් නොකළ යේසුස් වහන්සේට මුළු ලෝකයේ පාපය නිසා දෙවියන් වහන්සේ ඉදිරියේ චෝදනා ලැබීම අමාරු කාරියක් වූ, නමුත් අපව පාපයෙන් ගැලවීමට උන් වහන්සේට උවමනා විය. අපට සදාකාල ජීවනය දීමට වෙන මාර්ගයක් නැති නිසා අපගේ පාප උදෙසා මැරුණ සේක.

### ඔබේ අභ්‍යාසය සඳහා

3. යේසුස් වහන්සේගේ මෙම වචන කට පාඩම් කරන්න. ''මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා''.

## යේසුස් වහන්සේ අත් අඩංගුවට ගනුලබයි

යේසුස් වහන්සේ යාච්ඤා කරන අතර එතුමා ධෛර්යවත් හා ශක්තිමත් කරන්ට දේව දූතයන් පැමිණියහ. උන් වහන්සේගේ ගෝලයෝ නිදා සිටියහ. අවසානයේදී වේලාව පැමිණි වග දන්වීමට උන්වහන්සේ ඔවුන්ව අවදි කළ සේක. උන්වහන්සේව අත්අඩංගුවට ගන්ට පැමිණි සමූහයාට යූදස් මග පෙන්වීය.

> තමන්ව අල්ලා ගැනිමට පැමිණි නායක පූජකයන්ට හා දේව මාලිගාවේ මුළැදෑනින්ටත්, වැඩි මහල් උන්ටත් යේසුස් වහන්සේ මෙසේ කී සේක. ''නුඹලා කඩු මුගුරු රැගෙන අපරාධකාරයෙකුට විරුද්ධව එන්නාක් මෙන් මා අල්ලන්ට ආවාහුද? මම දේව මාලිගාවේ දවස් පතා උගන්වමින් නුඹලා සමඟ සිටියෙමි. නුඹලා මා ඇල්ලුවේ නැත.........'' ඔවුන් උන්වහන්සේව අත් අඩංගුවට ගෙන උත්තම පූජකයාගේ නිවසට ගෙනගියහ. ලූක් 22:52-54

### ඔබේ අභ්‍යාසය සඳහා

4. යේසුස් වහන්සේව පාවා දුන්නේ කුමන ගෝලයාද?.................................

# යේසුතුමාගේ නඩු විභාගය

යේසුස් වහන්සේව සය වරක් විනිශ්චය කරන ලදි.

1. විශ්‍රාම ගිය උත්තම පූජකයෙකු ඉදිරියේදී.
2. බලයලත් උත්තම පූජකයකු ඉදිරියේදී.
3. යුදෙව් පාලකයන් ඉදිරියේදී.
4. රෝම අණ්ඩුකාර පිලාත් ඉදිරියේදී.
5. අසල පලාතේ ආණ්ඩුකාර හෙරෝද් ඉදිරියේදී.
6. දෙවන වරටත් පිලාත් ඉදිරියේදී.

හිමිදිරි උදයේම නායක පූජකයෝ වැඩිමහල්ලන්ද ව්‍යවස්ථා ලියන්නන්ද මුළු මන්ත්‍රණ සභාවද සමග එක්වී හදිසියේම ඔවුන්ගේ සැලැස්ම සෑදූහ. ඔවුන් යේසුස් වහන්සේව දම්වැල්වලින් බැඳ ගෙන ගොස් පිලාත්ට භාර දුන්නෝය. මාර්ක් 15:1



ඔවුහු උන්වහන්සේට වරද තබන්ට පටන් ගෙන ''අපගේ සෙනඟ මුලා කරන, අධිරාජයාට ආදායම් බදු දෙන්ට එපා කියන, තමාම ක්‍රිස්තුස් නම් රජ යයි කියා ගන්න මේ මනුෂ්‍යයා අපි අල්ලා ගත්තෙමුයයි කීවෝය. ''ඔබ යුදෙව්වරුන්ගේ රජද''යි පිලාත් ඇසීය. ''ඔබම එය කියයි''යයි උන්වහන්සේ උත්තර දුන්සේක. ලූක් 23:2-3

''මාගේ රාජ්‍යය මෙලොවට අයිති එකක් වී නම් යුදෙව්වන් අතට මා භාර දීම වැලැක්වීමට මාගේ අනුගාමිකයන් සටන් කරනු ඇත......'' යේසුස් වහන්සේ කී සේක.

එවිට පිලාත් නැවත පිටතට ගොස් යුදෙව්වරුන්ට මෙසේ කීවේය. ''මොහුට දඬුවම් දීමට කිසි හේතුවක් මට නොපෙනේ. නමුත් චාරිත්‍රයට අනුව මම සැම විටම පාස්කුවේදී සිරකරුවෙක් නිදහස් කර දුනිමි. මා විසින් යුදයින්ගේ රජ නිදහස් කර දෙනවාට නුඹලා සතුටුද? එවිට සෙනඟ ''මොහු නොවේ බරබ්බස්'' යයි මොර ගසා කීවෝය. (බරබ්බස් වනාහි සොරෙක් විය) යොහන් 18:36–40

නායක පූජකයින් යේසුස් වහන්සේව තමන්ට භාර දුන්නේ උන්වහන්සේ කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් බව පිලාත් හොඳින් දැන සිටියේය. නමුත් නායක පූජකයෝ යේසුස් වහන්සේ වෙනුවට බරබ්බස් නිදහස් කිරීමට පිලාත් ගෙන් ඉල්ලීමට සෙනඟ පෙළඹුවෝය.

පිලාත් නැවත සෙනඟට කතා කරමින් ''යුදෙව්වරුන්ගේ රජයයි නුඹලා කියන්නාවූ මොහුට මා විසින් කුමක් කරනවාට සතුටුද''යි ඇසීය. ''ඔහු කුරුසියේ ඇණ ගසනු''යයි ඔවුන් මොර ගැසූහ. නමුත් ''මොහු මොන අපරාධයක් කළේද''යි පිලාත් ඇසීය. ''ඔහු කුරුසියේ ඇණ ගසනු''යයි ඔවුන් මොර ගැසූහ. සෙනඟ සතුටු කරන්ට කැමතිවූ පිලාත් ඔවුන්ට බරබ්බස් නිදහස් කර දුන්නේය. ඉන්පසු ඔහු යේසුස් වහන්සේට තලවා කුරුසියේ ඇණගසන්ට භාර දුන්නේය.
මාර්ක් 15:12–15

**ඔබේ අභ්‍යාසය සඳහා**

5. යේසුස් වහන්සේව විනිශ්චය කළේ කුමන ආණ්ඩුකාරයාද? ..............................

6. ආණ්ඩුකාරයා කීවේ කුමක්ද?

... (අ) මොහු වරද කරු බව මට පෙනේ.

... (ආ) මොහුට දොස් පැවරීමට කිසි හේතුවක් මට නොපෙනේ.

... (ඇ) නඩුව අහෝසියි.

# යේසුතුමා කුරුස පත්වෙයි.

## අනාගත කීම් ඉටුවිය

නඩු විභාගයේදී යේසුස් වහන්සේගේ සතුරෝ උන් වහන්සේ ගැන බොරු කීවෝය. හේවායෝ උන්වහන් සේට සරදම් කළෝය. කෙළ ගැසූහ. කසයෙන් තැලූහ.



ඔවුන් කුරුස රැගත් අපරාධකරුවන් දෙදෙනෙකු සමඟින් කල්වාරි කන්ද නම් ස්ථානයට පාර දිගේ උන්වහන්සේව ගෙන ගියහ. ඔවුන් උන්වහන්සේගේ අත් හා පාද කුරුසියෙහි ඇණ ගැසූ නිසා උන්වහන්සේ කවට කම් කරන සමූහයක්. මැද කුරුසියේ එල්ලී සිටි සේක. මෙ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය. උන්වහන්සේ මැරෙමින් සිටියේ මොවුන් වෙනුවෙන්ය. මෙම පව්කාරවූ මිනිසුන්ව සදාකාලික මරණයෙන් ගැලවීමටය. අහසින් ගිනි බස්වා ඔවුන් විනාශ කිරීමට උන්වහන්සේට හැකිවිය. නමුත් උන්වහන්සේ මෙසේ යාච්ඤා කළසේක. ''පියාණෙනි මොවුන්ට කමා වුව මැනව. ඔවුන් කුමක් කරන්නේ දැයි ඔවුන් නොදනිති.''

ගැලවුම් කාරයාණන් සෙනඟගේ පව් උදෙසා මැරෙන බව යෙසායා අනාගත වක්තෘ ලියා තිබුණේය.

උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය උන්වහන්සේ පොඩි කරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය අපට සමාදානය ගෙන දෙන දඬුවම උන්වහන්සේ පිටට පැමිණුනේය. උන්වහන්සේගේ පහර වලින් අපට සුවය ලැබී තිබේ. අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුලාවී එකිනෙකා තම තමාගේම මාර්ගයට හැරී ගියෙමුව. ස්වාමීන් වහන්සේද අප සියල්ලන්ගේ

අයුතුකම උන්වහන්සේ පිට තැබූ සේක.........උන් වහන්සේ බලහත්කාරකමින්ද විනිශ්චයෙන්ද පහකරනු ලැබූ සේක. .........උන්වහන්සේ ජීවත්ව සිටින් නන්ගේ දේශයෙන් සිඳ දමනු ලැබූ සේක. උන්වහන් සේ තලනු ලැබුවේ මාගේ සෙනඟගේ වරද නිසාය. යෙසායා 53:5–8

උන්වහන්සේ මිතුරෙකු විසින් පාවා දෙනු ලබන බවත් උන්වහන්සේගේ අත් සිදුරු කරනු ලබන බවත් උන්වහන් සේගේ ඇට අවසන්ධි වන බවත් මිනිසුන් අවමන් කරන බවත් තිත්ත කාඩිය බොන්ට දෙන බවත් උන්වහන්සේගේ වස්ත්‍ර සඳහා දාදු දමන බවත් වෙනත් අනාගත වක්තෘ වරු ලියා තිබුණි. අනාගත වක්තෘවරු ලියා තිබුණ ලෙස මේ සියල්ල යේසුස් වහන්සේගේ කුරුස පත්වීමේදී සිදු විය.

**ඔබේ අභ්‍යාසය සඳහා**

7. යෙසායාගේ අනාවැකිය තෙවරක් කියවන්න.

## යේසුස්වහන්සේගේ මරණය



යේසුස් වහන්සේ මැරෙනු බලා සිටි සැම දෙනාම උන්වහන්සේට කවට කම කළා නොවේ. සොරුන් දෙදෙනාගෙන් කෙනෙකු උන්වහන්සේ කෙරෙහි අදහා එතුමා අසලදීම කුරුසියේදී පවින් මිදුනේය.

ඔහු උන්වහන්සේට ''යේසුස්වහන්ස, ඔබ රජ කෙනෙකු සේ එන කල මා සිහිකළ මැනව''යි කීවේය. යේසුස් වහන්සේ උත්තර දෙමින් ''මම නුඹට කියමි අදම නුඹ මා සමඟ පාරාදීසයෙහි සිටින්නේය'' යි කී සේක.

ලූක් 23:42–43

දොළහේ සිට සවස තුන දක්වා හිරු නොබැබලී දේශය පුරා අන්ධකාරයක් විය. දේව මාළිගාවේ එල්ලෙමින් තිබුණ තිරය දෙකඩ විය. යේසුස් වහන්සේ මහත් හඬින් ''පියාණෙනි, ඔබගේ අතට මාගේ ආත්මය භාර දෙමි.'' කියා මිය ගිය සේක. ලූක් 23:44–46

යුධ මුලාදැනියාද, ඔහු සමඟ යේසුස් වහන්සේ රැකවල් කරමින් සිටි හේවායින්ද, පොලෝකම්පාවත්, සිදුවූ සියල්ලත් දැක බියපත්ව ''සැබැවින්ම මුන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය'' යි කීවෝය.

මතෙව් 27:54

## ඔබේ අභ්‍යාසය සඳහා

8. හිස් තැන්හි ඔබගේ නම ලියන්න.

යේසුස් වහන්සේ කුරුසියේදී මැරුණේ ........................................ ......ගේ පාප උදෙසාය. උන්වහන්සේ..................ගේ දඬුවම උසුලා........................ගැලවීම ලැබීමටත් සදකාල ජීවනය භුක්ති විඳීමටත් සුදුස්සකු කළ සේක........................ ..................උදෙසා ඔබගේ පුත්‍රයාණන් එව් නිසා දෙවියන් වහන්ස ඔබට ස්තුතියි.

## ශුභ පැතුම්

මෙම පාඨමාලාව නිම කිරීමටත්, ඔබගේ සහතිකය ලබාගැනීමටත් තව ඇත්තේ එක පාඩමක් පමණි. මෙම පාඩම ලැබුණු විගසම අපි සවැනි පාඩම ඔබ වෙත එවන්නෙමු.

ඔබේ නම: ..................................................

ලිපිනය: ..................................................

දිස්ත්‍රික්කය ..................................................

වයස..................ස්ත්‍රී පුරුෂ භාවය...........

අපේ ලිපිනය

**ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය**

**තැ. පෙ. 102**

**කොළඹ.**

සීමාසහිත ඉවැන්ජල් මුද්‍රණාලය 490/8, හැව්ලොක් පාර කොළඹ 6,